# බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ විනය පරීක්ෂණ නිලධාරී සංචිතයට සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවීම.

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්යය පටිපාටියේ 26 වගන්තියේ අංක (5) අනු වගන්තිය ප්‍රකාරව විනය පරීක්ෂණ නිලධාරී සංචිතයක් ස්ථාපනය කිරීම සඳහා, අයදුම්පත් කැඳවන දිනට බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සහිත පහත සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. සුදුසුකම්

(අ) පළාත් සභා රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සේවයෙන් විශ්‍රාමලත් මාණ්ඩලික නිලධරයන්

I. ස්වකීය සේවා කාලය තුළ දී, රජයේ ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමුවන උප ලේඛනය යටතේ හෝ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා විනය කාර්ය පරිපාටික රීතීන්හි පළමුවන උප ලේඛනය යටතේ දැක්වෙන වරදකට දඬුවම් නොලැබූ

හෝ

II. රජයේ ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උප ලේඛනය යටතේ හෝ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා විනය කාර්ය පරිපාටික රීතීන්හි දෙවන උප ලේඛනය යටතේ දැක්වෙන වරදක් කිරීමෙන් අනතුරුව, වසර පහක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්තා වූ මාණ්ඩලික නිලධාරීන්ගෙන්

(ආ) අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්දක් ඇති නීතිඥයන්

2. විනයානුකූල පරීක්ෂණ සඳහා ගෙවීම්

2018.07.31 දිනැති අංක 18/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව ගෙවීම් කරනු ලැබේ. එතකුදු වුවද මධ්‍යම රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ගෙවීම් කටයුතු පිළිබඳව වරින්වර පනවනු ලබන සංශෝධනවලට මෙම ගෙවීම් යටත් වනු ඇත.

3. අයදුම් කිරීමේ ක්‍රමය

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කළ යුතු ය. පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති, අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින් දරාගත යුතු ය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අවසන් වරට සේවය කළ අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය සහිතව **2021.03.30** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **"ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 628, 10 වන මහල, ජනජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය"** යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ

කෙළවරේ "**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ විනය පරීක්ෂණ නිලධාරී සංචිතයට අයදුම් කිරීම**" යන්න පැහැදිලි ලෙස සඳහන් කර එවිය යුතු ය. අයදුම්පත් භාර ගන්නා දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

4. අසම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී අයදුම්පතක් නැති වීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

5. නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති, ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව සකස් කර නියමිත දිනට හෝ එදිනට පෙර අයදුම්පත් ඉදිරිපත් කරන ලද සියලුම අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දැනුම්දෙනු ලබන ඉදිරි දිනකදී පවත්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කරනු ලබන කැඳවීමක් මෙම සංචිතය සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙසට සලකනු නොලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් නිවේදනයෙහි සඳහන් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. එම අවස්ථාවේදී අදාළ සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ / ඇයගේ අයදුම්පත්‍රය අවලංගු කෙරෙනු ඇත.

6. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේ ද පළ කර ඇත.

7. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ මෙම නිවේදනයෙන් ආවරණය වන / නොවන ඕනෑම කරුණක් සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

8. මෙම ගැසට් නිවේදනය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාද අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

තිලක් සෙනරත්
ලේකම්
බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
2021.02.10